# ඔසාමා බින් ලාඩන් වැනි මිනිසුන් මැද බරක් ඔබාමා වැනි මිනිසුන් ඇත




විජේවීර අත් අඩංගුවට ගත් ප්‍රේමදාස රජය, රූපවාහිනිය හරහා ජනතාව ඉදිරියට ඔහුව රැගෙන ආවේය. රූපවාහිනියේ තිරය මතින් ඔහුගේ අවසන් කතාවද විකාශය විය. විජේවීර කතාකළේ ජීවත්වීම පිළිබඳ බලාපොරොත්තු රැසක් හිතේ තබාගෙනය. ජනතාව ඉදිරියට ගෙනා ගරිල්ලා නායකයකුගේ ඉරණම කුමක්වේද යන්න ජනතාව නොදැන සිටියේය. එහෙත් පසුදා රාත්‍රියේ බොරැල්ල කනත්තේ ආදාහනාගාරයේදී ඔහු අළු වුයේ පණ පිටින්ය. විජේවීරගේ ඝාතනය පිළිබඳව ප්‍රේමදාස මුනිවත රැක්කේය. හමුදාව නිවේදන නිකුත් කළේය.

ඇමරිකන් සීල් හමුදාව විසින් බින්ලාඩන් අත් අඩංගුවට ගෙන මැරුවාද නැත්තම් මරාදමා සිරුර අත් අඩංගුවට ගත්තාද කියා කිසිවෙකුට කිසිවක් කියන්නට ඉතිරි නොකර බින් ලාඩන් අද අවසන් ගමන් ගොස් ඇත. බින් ලාඩන්ගේ අවසන් ගමන පිළිබඳව මුළු මුස්ලිම් ලෝකයම නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරද්දී ඉරානය පමණක් ඔහුගේ මරණය පිළිබඳව ඇමරිකාවට විරුද්ධව නිවේදන නිකුත් කරයි. ඉරානයට අනුව බින් ලාඩන් මිය ගොස් ඇත්තේ උණ රෝගයක් වැළදීමෙනි. බරක් ඔබාමාට නැවතත් ඇමරිකාවේ ජනාධිපති පදවියට පත්වීමට, ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කිරීම සඳහා ඔහු මෙසේ බොරු බේගල් ඇඳබාන බව ඉරානය පවසයි. එහෙත් පකිස්ථානයේ ඇබ්බාබේ වලින් සොරකම් කළ මිනිසා කවුරුන්ද යන්න නිශ්චිතවම දන්නේ ඇමරිකාවත් පකිස්ථානයත් පමණි. එකමුතු කමක් නැති එකිනෙකා පාවාදෙන්නා වු මුස්ලිම් ලෝකය තුළ බින් ලාඩන් හුදෙකලා වු ගරිල්ලා නායකයෙකි. ඔහු වාසය කළ නගරය තුළ විදුලි ආලෝකය විසන්ධි කළේ ඇමෙරිකාව නොවේ පකිස්ථානයයි. පකිස්ථානය නොදැන ඇමෙරිකාව විසින් බින් ලාඩන් ඝාතනය කිරීම අල්කයිඩාව හොඳින් දන්නා නිසා ඔවුන් ඔවුන්ගේ පළවෙනි පළිගැනීම ආරම්භ කළේ පකිස්ථානයෙනි.

අමෙරිකාව විසින් නිර්මාණය කළ බින් ලාඩන් ගේ අමෙරිකාවට එල්ල කළ බෝම්බ ප්‍රහාරයට පෙර බින්ලාඩන් ව පණපිටින් අල්ලා සිරගත කිරීමට ඇමරිකාවට තද බල ඕනෑකමක් තිබිණි. ඒ ඔවුන් විසින් නිර්මාණය කළ බිල්ල ඔවුන්ටම කවදා හෝ බිලි ගන්නා බව අමෙරිකාවට බව වැටුණු නිසාය. ප්‍රභාකරන්ට උදව් උපකාර කළ ඉන්දියාවටද, පසුව ප්‍රභාකරන් පණපිටින්




ලක්ෂ්මන් කොඩිතුවක්කු

අල්ලා ගන්නට උවමනාව තිබිණි. ඒ තමන් නිර්මාණය කළ බෝම්බ වලින් තමන්ට කැරකී ප්‍රහාර එල්ල කරන බව එවකට සිටි රජීව් ගාන්ධි ඇතුළු බුද්ධි අංශවලට ඉව වැටුණු නිසාය. ප්‍රජාතන්ත්‍රවාදයට වඩා ත්‍රස්තවාදය ඉක්මන් බව බිනලාඩන් හා ප්‍රභාකරන් ලෝකයට පෙන්-වන විට ඇමරිකාවත් ඉන්දියාවත් ප්‍රමාදය. එදා සැප්තැම්බර් එකොලොස් වෙනි දින පෙන්ටගනයට ගිය ගුවන් යානය නිවැරදි වුයේ නම් රජීව් ගාන්ධි සේම ජෝර්ජ් බුෂ්ගේ ද දේහය ලෝකවාසීන්ට දැක බලාගන්නට ඉඩ තිබිණි.

ශ්‍රී ලංකාව, මේ අවස්ථාවේදී මුහුණ දී තිබෙන ප්‍රශ්නයේ බරපතල කම ගැලරි න්‍යායය අනුගමනය කරන අවස්ථාවාදීන් අවබෝධ කරගෙන නැත. බින්ලාඩන් හා ප්‍රභාකරන් සමාන කිරීමට යෑම මේ ප්‍රශ්නයට විසඳුමක් නොවේ. ප්‍රභාකරන්ට සමස්ථ ලෝක දෙමළ ප්‍රජාවෙන් සහයෝගය නොමඳව ලැබුණු බව නොරහසකි. ප්‍රභාකරන් බිහිවුයේ යම්කිසි පීඩනයක් ලැබූ ජනතාවගේ ප්‍රශ්න වලට අනුවය. ඔහු එය අනාගෙන මරුවිකල්ලේ දඟලමින් අහිංසක ජනතාව මරා දැමුවද, ඔහු මුලින්ම අවිය එසවුයේ තමාගේ ජනතාවට හා තමාට ප්‍රහාර එල්ල කළ හමුදවට විරුද්ධවය. එයට දියහැකි හොඳම උදහරණය වන්නේ අභිමාන් චිත්‍රපටයේ වෙළඳ දැන්වීමයි. ඒ ඔවුන් එක් කළේද සංගීතයයි. වෙන් කළේද සංගීතයයි. ප්‍රභාකරන් ජනතාව සමඟ එක් කළේද අපේම දේශපාලනයයි. ඔහු වෙන් කළේද දේශපාලනයයි. අපේම දේශපාලකයන්ගේ අමන තකතීරුකම් වලින් බිහිවු ප්‍රභාකරන් ජනතාවගෙන් වෙන් කර මරා දැමීම කළේත් ඒ දේශපාලනයෙන් බිහිවු ඊළඟ පරම්පරාවයි.

බින් ලාඩන් එසේද? නැත. ඔහු ධන කුවෙරයකුගේ පුතෙකි. ආගම් වාදය හා මුස්ලිම් නීති රීති ලෝකය තුළ ව්‍යප්ත කිරීමට තදබල උවමනාවක් තිබූ අමෙරිකාවේ සහයෝගය මත ඇප්සන් හි රුසියන් හමුදවට විරුද්ධව ප්‍රථමයෙන් අවිය අතට පත් ගරිල්ලා නායකයායි. ඉරාකයේ සදම් හුසේන්ට ඉරාකය නැති වුයෙත් ජීවිතය නැති වුයේත් ඔහු නිසායි. ඇමෙරිකාව ඉරාකයේ අනාගත තීරණය ඉක්මන් කළේ ඔහු අමෙරිකාවට එල්ල කළ ත්‍රස්ත ප්‍රහාරය නිසාය. අමෙරිකාව අවිශ්වාස කළේ බින් ලාඩන්ගේ සැඟවීම ඉරාකයේ හෝ ඇෆ්ගනිස්ථානයේ හෝ සිදු වී ඇති බවය. ඔහුගේ ත්‍රස්තවාදය දියත් වුයේ තමාගේ ආගම දහමට පක්ෂවය. ඔහුට වෙනම රටක් පිළිබඳව අවශ්‍යතාවයක් නොතිබිණි. මුස්ලිම් ජාතියේ හා ආගමේ ව්‍යාප්තවාදය පිළිබඳව දැඩි විශ්වාසයකින් කටයුතු කළ ඔහුගේ එකම අරමුණ වුයේ තමාගේ ආගමට විරුද්ධව යන තමාගේ ජාතියෙන් හෝ පළිගැනීමයි.

ඔසාමා ඇමෙරිකාවේ ජනාධිපති වීමෙන් පසු ඔහුගේ මරණය මේ තරම් ඉක්මන් වේ යැයි ඔහුද නොසිතන්නට ඇත. ඒ ඔබාමා අමෙරිකන් නොවු ඇමෙරිකන් කාරයෙක් නිසාය. අවි අත දරාගෙන සැඟවී ත්‍රස්තවාදය ක්‍රියාත්මක ගරිල්ලා නායකයන් තේරුම් නොගත් එක් දෙයක් ඇත. ඒ දේශපාලන බලය හමුවේ ජාතිය ආගම පවා යටපත් වෙන බවයි. අමෙරිකාවේ ජනාධිපති තනතුරට මුස්ලිම් භක්තිකයකු පත්වුවත් බින් ලාඩන් මරා දමනු ඇත. ඒ බලයට පත්වෙන ජනාධිපතිගේ මූලික අරමුණ අවශ්‍යතාවය බලය රැකගැනීම නිසායි. අපේ රටේද ජනාධිපති තනතුරට දෙමළ ජාතිකයෙකු පත් වුවානම් ප්‍රභාකරන් මැරෙන්නේ මීට පෙරය. අද ඔබාමා ඇඟිල්ල දිගුකරමින් සිරියාවේ ජනාධිපතිවරයාට ඉල්ලා අස්වන ලෙස අණකරයි. ලිබියාවේ ගඩාපි මරා දැමීමට තැත් කරයි. තමන්ට තර්ජනයක් ඇති ප්‍රබල රටවල් වලට ඇඟිල්ල දිගු නොකර කටින් පමණක් පිළිතුරු දෙන ඔබාමාගේ මූලික අභිප්‍රාය වී ඇත්තේ අවි බලය නැති අරාබි ලෝකය මට්ටු කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව වැදි බණ දේශනාකරන ඔහු ඔවුන්ට පක්ෂ එහෙත් දැඩි ඒකාධිපති නායකත්වයකින් යුතුව රට පාලනය කරන සවුදි අරාබිය, කුවේටය, ඕමාන් ආදී රටවල් නායකයන්ට ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් මැතිවරණ පවත්වා සාධාරණ නායකයකු පත් කරගන්නට කියන්නේ නැත.

ජීවත් වු බින් ලාඩින් ට වඩා මිය ගිය බින් ලාඩින් ඇමෙරිකාවට ප්‍රශ්න රැසක් මතු කරයි යයි කියා දේශපාලන විද්වතුන් පැවසුවත් අද ලෝකයේ එසේ සිදුවන්නේ නැත. ඒ ප්‍රශ්න පත්‍රය නිර්මාණය කරන එවුන් නිහඬ නිසාය. ඔවුන් අමෙරිකාවට එරෙහිව කිසිදු ප්‍රශ්නයක් තර්කයක් නඟන්නේ නැත. එහෙත් මිය ගිය ප්‍රභාකරන් අපේ රටට ප්‍රශ්න රැසක් මතු කර ඇත. ඒ අපිට විරුද්ධව ප්‍රශ්නපත්‍රය හඳන එවුන්ට අපි අපි ප්‍රශ්න රැසක් ලබා දී ඇති නිසාය. නමුත් ඒ ප්‍රශ්නවලින් ප්‍රයෝජනගන්නට තනන්නේ ඉන්දියාවයි. අද ඉන්දියාවට බොරදියේ මාළු බෑමට පුළුවන. ඔවුන්ට අවශ්‍ය සීපා ගිවිසුම 13 වන සංශෝධනය ආදිය ක්‍රියාත්මක කිරීමට මාන බලන්නේ දරුස්මාන් වාර්තාවට එරෙහිව අපට පක්ෂවීමට සිටින එකම අසල්වාසී බලවතා ඉන්දියාව නිසාය.

එසේම තම නායකයාගේ අභාවය පිළිබඳව දැඩිව කුපිතව සිටින අල්කයිඩා නායකයින්ගේ පළිගැනීම මීටත් වඩා ලෝකය තුළ ව්‍යාප්ත වීමට පුළුවන. ඒ අතරින් ඔවුන්ට අද අමෙරිකාවට කිට්ටු කිරීමට බැරිය. ඊළඟට ඔවුන්ගේ බෝම්බය බ්‍රිතාන්‍යයේ වීමට පුළුවන. මෙරටේ වීමටද පුළුවන. ඒ ඕස්ට්‍රේලියාවද අමෙරිකාවට පක්ෂව තම මුළු ශරීරයම දන් දෙන්නට බලා සිටින රටක් නිසාය. අල්කයිඩා සංවිධානය හමුවේ ප්‍රභාකරන් යනු කුඩා කඩියෙකි. අල්කයිඩා සංවිධානයත් එල්ටීටී සංවිධානයත් සම කිරීම සාධාරණ නොවන්නේ නායකයා මැරූ පමණින් ත්‍රස්තවාදය ක්‍රියාත්මක කිරීම නතර නොකරන එකම සංවිධානය අල්කයිඩාව නිසාය.

අපි ප්‍රභාකරන් මරා දෙවසරක් ගතවුවත් දෙමළ ජනතාවට දෙන විසඳුමක් පිළිබඳව මෙතෙක් පවතින්නේ ඉඟි බිඟියක් පමණි. තවත් ප්‍රභාකරන් කෙනෙකු බිහිවෙන තුරු අඳුරේ අතපත ගාන විසඳුම් වලට තිත තබා ඔවුන්ගේ ප්‍රශ්නවලට සැබෑ උවමනාවකින් විසඳුම් සෙවීම ජාති හිතෙෂී සැමගේම කාර්යබාරයයි. ජයග්‍රහණය ගැන උදම් ඇනීම පසෙක තබා විසඳුම් සෙවීම කාගේත් යුතුකමය. ඒ පිළිබඳව සාකච්ඡා කළ යුත්තේ ඉන්දියාවේ පැලැස්තර සමඟ නොව උතුරේ දෙමළ ජනතාව ආදරය කරන සැබෑ නායකයකු තෝරාගෙන ඒ නායකයා සමඟය. මුළු රටටම ආදරය කරන ජනාධිපතිවරයකු සිටියද, ජනතාවට දැනෙන ප්‍රශ්න ඊට වඩා වෙනස්ය. ආදරය හා පරිපාලනය පිළිබඳ ගැටළුව හඳුනාගෙන සාධාරණ බලතල බෙදීමක් අවශ්‍ය බව ප්‍රභාකරන්ට කලින් සිට අපි අත්දැකීම් වලින් අත්විඳි ජනතාවක් වශයෙන් අවබෝධයක් ලබා ඇත්තෙමු. අපි මුදගත්තේ ප්‍රභාකරන්ගේ වස්තුව බුදලය නොවේ. අහිංසක දෙමළ ජනතාව ජීවත් වන අපේම රටයි. වන සිව්පාවුන් මැදින් දෙවි දේවතාවුන් බිහිවන්නේ ඒ විසඳුම් මතයි.

ඔබාමා තව තව මිනිමරනු ඇත. ලෝකයට තව තවත් අණ දෙනු ඇත. අල්කයිඩාවද ඊළඟ නායකයාද එලෙසම තවත් මිනී මැරීමට සැහැදී පැදී ඇත. එය නොමියෙන නොසන්සිඳෙන වෛරයකි. අද අපේ නායකයන් ඒ අතින් වාසනා-වන්තය. ජනතාවද වාසනාවන්තය. අපේ රටේ බෝම්බ නොපිපිරෙන්නේ ඒ නිසාය. එහෙත් බෝම්බයට අනුකම්පාවක් නැත කියා රූපවාහිනියේ නැවත නොපෙන්වන්නට අපි වග බලා ගත යුතුය.

